## පෙර භාවිතයට – අළු බදාදා (A) – 18 පෙබරවාරි 2026

*යෝවෙල් 2:12–18; 2 කොරින්ති 5:20–6:2; මතෙව් 6:1–6, 16–18*

## ආරම්භක වදන්

දවසක් සංචාරකයෙකු වියළි කාන්තාරයක අගෙහි නතරව, පැරණි මාර්ගෝපදේශකයෙකුගෙන් අහුවා:
"මෙය හරහා යන්න කොච්චර කාලයක් යයිද?"
මාර්ගෝපදේශකයා පිළිතුරු දුන්නා: "යන්න."
"ඒත් කොච්චර?" කියා සංචාරකයා නැවතත් අහුවා.
"යන්න," කියාම ඔහු නැවත කියුවා.
සංචාරකයා ගමන ආරම්භ කළාම පසුව, මාර්ගෝපදේශකයා අවසානයේ කිව්වා: "දවස් හතළිහක් විතර."

ආදරණීය සහෝදර සහෝදරියන්වහන්සලා, අද අපිත් එවැනි ගමනක අගෙහි සිටිනවා. අළු බදාදා සමඟ අපි ලෙන්ට් කාලයේ කාන්තාරයට පා තබනවා—ජීවිතයෙන් පැන යාමට නොව, ජීවිතයේ දිශාව නැවත සොයාගැනීමට වෙන් කළ දවස් හතළිහක්.
මේ දවස් වර්ෂයේ කලබලයෙන්, අපගේ පුරුදු සහ දෛනික චක්‍රයෙන් වෙන් කරගත් දවස්. දෙවියන්වහන්සේ අප තුළ ක්‍රියා කිරීමටත්, අප හරහා ක්‍රියා කිරීමටත් ඉඩ ලබාදෙන කාලයක්.

අළු බදාදා අපට බොහෝ විට අමතක වන සත්‍ය දෙකක් මතක් කරයි: ජීවිතය බිඳුමය. කාලය වටිනාය. එහෙත් එය බලාපොරොත්තුවේ වදනක්ද කියයි: දෙවියන්වහන්සේ අපට සමීපය, කරුණාවේ කාලය දැන්ය.
ලෝකයේ දුක්විඳිමින් සිටින අය—විශේෂයෙන් යුද්ධ, හිංසාව, අසාධාරණය නිසා පීඩා විඳින අය—

මතක කරගෙන, අපගේ හදවත් දෙවියන්වහන්සේ වෙත නැවත හැරවන්නැයි අපි ඉල්ලමු. එවිට අපි සාමය, කරුණාව සහ සුවය ගෙන එන උපකරණයන් වෙමු.
ඒ නිසා, ස්වාමින්වහන්සේ ඉදිරියේ අපි අවංකව නවතිමු. උන්වහන්සේගේ දයාව ඉල්ලමු.

## දේශනය 1 – "ඔබගේ මුළු හදවතින් මට නැවත හැරෙන්න"

දවසක් කෙනෙක් තමන්ගේ සීයාගේ දරුවන්ගබඩාවක පැරණි දිකදර්ශකයක් (compass) සොයාගත්තා. කුතුහලයෙන් එය රැගෙන කඳුකර ගමනකට ගියා. නමුත් ඔහු හැරෙන හැරෙන පැත්තට කටු අස්ථිරව පෙන්නුම් කළා. කෝපයෙන් ඔහු එය ඉවතට දමන්න යද්දී, වයසක ගමන්කරුවෙක් කිව්වා:
"දිකදර්ශකය කඩලා නෑ. ඔබ ලෝහයට ඉතා ළඟයි. ටිකක් දුරට ඉවත් වුනාම, එය උතුර පෙන්නුම් කරයි."

ලෙන්ට් කාලය අපට දෙවියන්වහන්සේ කියන වදනක් වගේ: ටිකක් ඉවත්වෙන්න.
ඔබගේ හදවතේ දිශාව වැරදි කරන දේවලින්—ශබ්දයෙන්, පුරුදු වලින්, අවධානය හරවන දේවලින්, අසත්‍ය ආරක්ෂාවලින්—ටිකක් ඉවත්වෙන්න. එවිට ඔබගේ අභ්‍යන්තර දිකදර්ශකය නැවතත් දෙවියන්වහන්සේ වෙත යොමු වේවි.
අළු බදාදා එම දිකදර්ශකය අපගේ අතට දෙයි.

### 1. අළු – මෝහය නැති සත්‍යය

අද අපි අසන පළමු වදන් අස්වැන්නක් වගේ වේදනාවක් ඇති කරයි:
"ඔබ අළුය; අළුටම ඔබ නැවත හැරෙන්නෙහිය."
සෑම විටම තරුණව සිටින්න, ශක්තිමත් ලෙස

පෙනෙන්න, සීමාවන් වළක්වන්න කියන ලෝකයක මේ වචන අපහාසයක් වගේ දැනේ. අපි දුර්වලතාව සඟවන්න, මරණය නොසලකා හරින්න, එය දුරින් තබාගන්න ඉගෙනගෙන තියෙනවා.
නමුත් අළු බදාදා එම මෝහයට එකඟ නොවේ. එය අපට සත්‍යය කියයි—බිය ගැන්වීමට නොව, නිදහස් කිරීමට.

දවසක් දැඩි හෘදයාබාධයකින් ජීවිතය බේරුණු විශාල සමාගමක ප්‍රධානියෙක් කිව්වා:
"මගේ ජීවිතයේ පළමු වතාවට මට තේරුණා, මම නැතිවුවත් ලෝකය හොඳින්ම ඉදිරියට යන බව."
එම අවබෝධය ඔහුව වෙනස් කළා. සාර්ථකත්වය පසුපස ධාවනය අඩු කරලා, සබඳතා පෝෂණය කරන්න ඔහු වැඩි කාලය වැය කළා.
මරණය පිළිගත් විට, ජීවිතයේ ප්‍රමුඛතා වෙනස් වේ. අළු එයම කරයි. ජීවිතය කෙටි නමුත් අර්ථවත් බව අපට මතක් කරයි. අපි ජීවත්වෙන ආකාරය වැදගත්ය.

## 2. "ඔබගේ මුළු හදවතින් මට නැවත හැරෙන්න" (යෝවෙල්)

යෝවෙල් අනාගතවක්තෘවරයා කියන්නේ: "ඔබලා ඔබලාම හොඳ කරගන්න" හෝ "තව ටිකක් උත්සාහ කරන්න" කියලා නොවෙයි.
ඔහු කියන්නේ: "ඔබගේ මුළු හදවතින් මට නැවත හැරෙන්න."
නැවත හැරෙන්න කියන්නේ—අපි දැනටමත් දෙවියන්වහන්සේට අයත් බවයි.
ලෙන්ට් යනු දෙවියන්වහන්සේගේ ප්‍රේමය ලබාගන්න උත්සාහ කිරීමක් නොව, එයට නැවත පැමිණීමකි.

උදාහරණයක්: දවසක් පූජකයෙකු කතෙකිසම් පන්තියක දරුවෙකුගෙන් ඇහුවා: "පශ්චාත්තාපය

කියන්නේ මොනවද?"
දරුවා කිව්වා: "වැරදි මාර්ගයෙන් යනකොට හැරෙලා නිවැරදි මාර්ගයට එන එක."
සරලයි—නමුත් ගැඹුරු ආත්මික සත්‍යයක්.
පශ්චාත්තාපය යනු අපි අපව දෝෂාරෝපණය කරගැනීමක් නොවෙයි. එය දිශා වෙනස් කිරීමකි. දෙවියන්වහන්සේට අපගේ අභ්‍යන්තර දිකදර්ශකය නැවත සකස් කිරීමට ඉඩ දීමකි.

## 3. ශාන්ත පාවුළුතුමාගේ හදිසිය: "දැන්මයි කාලය"

ශාන්ත පාවුළුතුමා පණිවිඩය තවදුරටත් දැඩි කරයි:
"දැන්මයි පිළිගත හැකි කාලය. දැන්මයි සුවිශේෂණයේ දවස."
ජීවිතය සන්සුන් වූ විට නොවෙයි. විශ්‍රාම ගත් පසු නොවෙයි. ඉස්ටර්ට පසු නොවෙයි. දැන්.

දවසක් කෙනෙක් කිව්වා: "මට වැඩි කාලයක් ලැබුණාම මම යාච්ඤා කරනවා."
අවුරුදු ගණනාවකට පසු ඔහු පිළිගත්තේ මෙහෙමයි: "කාලය කවදාවත් ආවේ නැ—නමුත් හේතු නම් බොහොමයක් ආවා."
ලෙන්ට් අපගේ එම හේතු කපා හරින්නෙයි. කරුණාව කල් දැමිය හැකි දෙයක් නොවන බව අපට මතක් කරයි. දෙවියන්වහන්සේ අපව හමුවන්නේ අදයි—අපි සිතන අදිති අනාගතයක නොවෙයි.

## 4. වැරදි හේතුවකට හොඳ දේ කිරීමේ අවදානම

සුවිශේෂයේ යේසුස්වහන්සේ පූජනීය ක්‍රියා තුනක් සඳහන් කරයි: යාච්ඤාව, උපවාසය, දානය.
උන්වහන්සේ ඒවා විවේචනය නොකරයි. නමුත් සූක්ෂම අවදානමක් හෙළි කරයි—පෙන්වීම, ප්‍රදර්ශනය.
පුරුදු කියමනක් තියෙනවා: "අහංකාරය,

පූජනීයභාවයවත් කන්නාඩියක් කරගන්න පුළුවන්.”
යේසුස්වහන්සේ දන්නවා, ආගමික ක්‍රියා පහසුවෙන්ම ප්‍රසිද්ධිය, පාලනය හෝ ස්වයංතෘප්තිය ගැන විය හැකි බව.
ඒ නිසා උන්වහන්සේ වාරෙන් වාර කියන වදනක් තියෙනවා: “රහසින් දකිනා ඔබගේ පියාණන්වහන්සේ.”

දෙවියන්වහන්සේට පෙනුම වැදගත් නැහැ.
උන්වහන්සේ බලන්නේ හේතුවටයි, හදවතටයි.
දවසක් භික්ෂුවෙකුගෙන් ඇහුවා, “ඔබ ඇයි එතරම් නිහතමානීව යාච්ඤා කරන්නේ?”
ඔහු පිළිතුරු දුන්නා: “දෙවියන්වහන්සේට අසන්න අපහසු නැහැ—නමුත් මගේ හදවතට අසන්න අපහසුයි.”
ලෙන්ට් එම හදවත සුව කිරීමටයි.

## 5. යාච්ඤාව, උපවාසය, දානය – එක් මාර්ගයක්, දිශා තුනක්

මෙම ක්‍රියා වෙන් වෙන් ව්‍යාපෘති නොවෙයි. ඒවා එක් ප්‍රේම චලනයක්.
යාච්ඤාව අපව දෙවියන්වහන්සේ වෙත හැරවයි.
දානය අපව අන් අය වෙත හැරවයි.
උපවාසය අපව ඇතුළතට—නිදහස වෙත—හැරවයි.

උපවාසය බොහෝවිට වැරදි ලෙස තේරුම් ගන්නවා. එය ආහාර පාලනයක් හෝ විනය පෙන්වීමක් නොවෙයි.
එහි මූලික ප්‍රශ්නය: මාව පාලනය කරන්නේ මොනවද?
කෙනෙක් කිව්වා: “මම උපවාස කරන්න උත්සාහ කළා. එවිට මට තේරුණා—බොහෝ වෙලාවට මම කන්නේ කුසගින්න නිසා නොව, බෝරුව, ආතතිය, හෝ පුරුද්ද නිසා කියලා.”

එම අවබෝධයම කරුණාවක්.
සත්‍ය උපවාසය ඉඩක් සාදයි—දෙවියන්වහන්සේට, කරුණාවට, සවන් දීමට.
උපවාසය අපව මෘදු, ඉවසීමෙන් යුත්, දුප්පතුන් ගැන සැලකිලිමත් නොකරන්නේ නම්, එය තම අරමුණ අහිමි කරගනී.

## 6. අළු අවසාන වචනය නොවේ

අද අපි ලබන අළු, කලින් ජයග්‍රහණයේ සංකේත වූ පලාස් කොළවලින් ලැබූවකි—දැන් අළු.
මෙය අහඹු දෙයක් නොවේ. එය කියන්නේ: අපගේ සාර්ථකත්වයවත් මැලවී යයි.
එහෙත් එය තවත් සත්‍යයක් කියයි: අවසන් වුණා වගේ පෙනෙන තැනකින්වත් දෙවියන්වහන්සේ නව ජීවිතය ගෙන එයි.

අළු සළකුණු කරන්නේ වෘත්තයක් හෝ රේඛාවක් නොව—කුරුසයක්.
ඒ කුරුසය බලාපොරොත්තුව ප්‍රකාශ කරයි: අපගේ අළු ක්‍රිස්තුස්වහන්සේ විසින් ස්පර්ශ කර ඇත.
ගෙවතුකරුවෙකු කිව්වා: “හොඳම මැටි ලැබෙන්නේ මැරුණු දේවලින්.”
දෙවියන්වහන්සේ අපගේ අසාර්ථකතා, අහිමිවීම්, බිඳුනාවන් අපතේ යවන්නේ නැහැ.
උන්වහන්සේගේ අතින් ඒවා සාරවත් භූමියක් වෙයි.

වයලින් ගුරුතුමාකෙනෙක් තම ශිෂ්‍යයාට කිව්වා: “වැරදි නොකරන්න පුහුණු වෙන්නේ නෑ. වැරදි වලට බය නොවෙන්න පුහුණු වෙන්නේ.”
ලෙන්ට් එවැනි කාලයක්. පූර්ණ වීමට නොව, දෙවියන්වහන්සේ ඉදිරියේ භය නැතිව—අවංකව, විවෘතව, නැවත ආරම්භ කිරීමට සූදානම් වීමටයි.

අළු සළකුණු කරගෙන මේ දවස් හතළිහ ගමන් කරන විට, අඳුරු මුහුණු නොව—

බලාපොරොත්තුවෙන් පිරුණු හදවත් අපට ලැබේවා.
මන්ද අපව නැවත කැඳවන දෙවියන්වහන්සේ කරුණාවන්තය, දයාබරය, කෝපයට මන්දගාමිය, කරුණාවෙන් සම්පූර්ණය.
අළු බදාදා අපට කියන්නේ: අපි කවුද—අළු.
ලෙන්ට් කියන්නේ: දෙවියන්වහන්සේ කවුද—විශ්වාසවන්තය.
ඉස්ටර් කියන්නේ: අපි යන්නේ කොහෙද—ජීවිතයට.

"දෙවියනි, අප තුළ පිරිසිදු හදවතක් නිර්මාණය කර, ස්ථිර ආත්මයක් නැවත නවීකරණය කරන්න."
ආමෙන්.

කෙටි දේශනය 2 – කතාවකින් ආරම්භ වී කතාවකින් අවසන් වන දේශනය

දවසක් ප්‍රසිද්ධ වයලින් වාදකයෙකු කාර්යබහුල උමං දුම්රිය ස්ථානයක, කිසිවෙකු හඳුනා නොගන්නා ලෙස වාදනය කළා. බොහෝ දෙනා ඉක්මනින් පසුකර ගියා. කිහිප දෙනෙක් පමණක් නවතිලා අහුවා.
දවස් කිහිපයකට පසු, ඒම වාදකයා සංගීත මණ්ඩපයක් පුරවලා වාදනය කළා. මිනිසුන් විශාල මුදලක් ගෙවා අහුවා.
සංගීතය වෙනස් වෙලා තිබුණේ නෑ. වෙනස් වුණේ—එයට දුන් අවධානයයි.

අළු බදාදා යනු අපගේ කාර්යබහුල ජීවිත අතරමග දෙවියන්වහන්සේ නිහතමානීව වාදනය කරන සංගීතය වගේ.
ලෙන්ට් අපට නවතින්න, අහන්න, සහ අහන්න කියයි: මම ඉක්මනින් පසුකර ගිය දේවල් මොනවද?

මධ්‍යම සිතුවිල්ල

අද කියවීම් ලෙන්ට් හදවත හරහා පැහැදිලි රේඛාවක් ඇඳයි.
යෝවෙල් අනාගතවක්තෘවරයා හඬ ගසයි: "ඔබගේ මුළු හදවතින් මට නැවත හැරෙන්න."
ශාන්ත පාවුළුතුමා කියයි: "දැන්මයි පිළිගත හැකි කාලය."
යේසුස්වහන්සේ සැහැල්ලුවෙන් නමුත් යථාර්ථයෙන් කියයි: යාච්ඤාව, උපවාසය, දානය—හොඳ දේවල් වුවත්—වැරදි හේතු වලින් කළ හැකි බව.

දරුවෙකු දවසක් ඇහුවා: "ලෙන්ට්ට චොකලට් අත්හැරන්නේ ඇයි?"
අම්මා කිව්වා: "යේසුස්වහන්සේ මතක් කරගන්න."
දරුවා ටිකක් සිතලා කිව්වා: "එහෙනම් අපි තවත් කාරුණික විය යුතු නේද?"
එම ප්‍රශ්නයම සුවිශේෂයේ හදවතට යයි.

අද අපි ලබන අළු අප ගැන සත්‍යය කියයි: අපි දුර්වලයි, සීමිතයි, අනෙකා මත රඳා පවතින අය. නමුත් ඒ අළු කුරුසයේ හැඩයෙන් සළකුණු කරලා තියෙන්නේ—අපගේ දුර්වලතාව දෙවියන්වහන්සේගේ දයාවෙන් වැළඳී ඇති බව මතක් කරමින්.

භික්ෂුවෙකු කිව්වා: "ලෙන්ට් යනු වෙනත් කෙනෙක් වීමක් නොව, දෙවියන්වහන්සේ දැනටමත් අප තුළ දකිනා කෙනා බවට පත්වීමයි."
මේ දවස් හතළිහ අපට අවංකව යාච්ඤා කරන්න, සරලව ජීවත් වෙන්න, වඩා උදාාරව ප්‍රේම කරන්න උදව් කරන්නේ නම්—ඉස්ටර් යනු අපි උත්සවයක් ලෙස පමණක් නොව, නව ජීවිතයක් ලෙස ආරම්භ කරන දවසක් වේවි.

**ආමෙන්.**

- **Translated by Mrs. Lasanthi Peter**